

## ලියා දන්වන වග යි

### වැදගත් මිනිසුන් පාර්ලිමේන්තුවට යවන්න

නැවතත් මහ මැතිවරණයක් ළං වෙමින් තිබෙයි. සුපුරුදු ලෙස මනාප ඉල්ලා ඡන්ද දායකයන් හමුවේ කෙරෙන කන්කෙඳිරි ගෑම ඇරඹී ඇත. යලිත් වතාවක් මාසයකට හමාරකට ඡන්ද දායකයා රජ වී ඇත. මනාප ගැසීමේ බලය දැන් ඇත්තේ ඡන්ද දායකයා අතේ ය. තමන්ගේ පක්ෂය කුමක් වුවත් මේ වතාවේ වත් පාදඩයන් පාර්ලිමේන්තු නොයවන්නට ඔවුන් වග බලා ගත යුතු ය.

විප්‍රවාසී ඔබේ නෑයන්ට මේ බව සිහිපත් කරන්න. පාදඩයන් හොරුන් මිනීමරුවන් රස්තියාදුකාරයන් ස්ත්‍රී දූෂකයන් සහ සියලු ආකාරයේ විෂම බලවේග වලට අනුබල හා ආධාර දෙන්නවුන් වෙනුවෙන් සිය මනාපම පාවිච්චි නොකරන මෙන් ඔබේ නෑයන්ගෙන් ඉල්ලා සිටින්න.

මේ දූෂිත ක්‍රමයේ මහා පරිමානයේ වෙනසක් ඇති කළ නොහැකි වුවත් අඩුම තරමින් යම් තරමක් දුරට හෝ පිරිසිදු දේශපාලකයන් පිරිසක් පාර්ලිමේන්තුවට යවන්නට උත්සාහ ගැනීමෙන් රටට සිදුවන යහපත මෙතෙකැයි කියා කිව නොහැකි තරම් යයි අපි සිතමු. අඳුරට ශාප කරමින් නොසිට කුඩා පහනක් හෝ දල්වමු.

### සම්මානය අවමානයක් නොවීමට

ශ්‍රී ලංකාවේ නිදහස් දිනය වෙනුවෙන් මෙල්බන් සමාජයේ යම් යම් ක්ෂෙත්‍ර වලින් කැපී පෙනෙන සේවාවක් කළ පිරිසකට අගැයීම් සම්මාන පිරිනැමීමට ගත් පියවර පැසසුම් කටයුතු ය. එය පමා වී හෝ ගත් වැදගත් පියවරකි. කිසිදු අගැයීමක් නොලබා සමාජ මෙහෙවරෙහි යෙදී සිටින බොහෝ අයට මෙවන් සම්මානයකින් දිරියක් ගෙනදීම පුද්ගලිකව ඔවුන් වෙනුවෙන් කෙරෙන යුතුකමක් වනවා පමණක් නොව පොදු මහත් සමාජයටම කෙරෙන සේවයක් ද වෙයි. එබැවින් ඒ කටයුතු සංවිධානය කළවුන්නට අපේ ස්තුතිය හිමිවෙයි.

එසේම මේ සම්මාන පිළිබඳව සමාජයේ යටි තලයේ දැන් දැන් පැතිරෙමින් පවතින කතා බහට ද මේ සංවිධායකයන් ඇහුම් කන්දෙන්නේ නම් මැනැවැයි සිතමු. සමහර ක්ෂෙත්‍ර වලදී ඉතාම සුදුස්සන්ට සම්මාන ලැබුණත් තවත් සමහර ක්ෂෙත්‍ර වල සම්මාන ලද සමහරුන්ට වඩා සුදුස්සන් යෝජිත නම් අතර සිටි බවට පැතිරෙමින් පවතින කතාව ඇත්තක්ද? එසේ නම් මේ සම්මාන ප්‍රදානයේදී සම්මානයෙන් පිදුම් ලැබිය යුතු සමහරුන් කැපී ගියේ කෙසේද? මූණ බලා පුද්ගලික හිතවත් කම් මත දෙන සම්මාන වල වටිනා කමක් තිබේද?

මේ සම්මාන සඳහා එක් එක් අංශයෙන් යෝජනා වූ සම්පූර්ණ නම් ලැයිස්තුව ප්‍රසිද්ධ කරන්නට සංවිධායකයනට ශක්තියක් තිබේද? එසේ කළ හැකි නම් සම්මාන ප්‍රදානයේ අව්‍යාජත්වය මැන ගන්නට අපට හැකිවනු ඇත. එසේ ප්‍රසිද්ධ නොකරන්නේ නම් එයින් හැඟෙන්නේ සඟවාගන්නට යමක් සංවිධායකයන්ට ඇති බව ය

සන්නස
www.sannasa.net




**සංස්කරණය / Editor**

අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**

ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක /Asst. Editor**

ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**

අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සමබන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandta Eeriyagama
08 8331 2318

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax : 03 3796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .